# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2142/91 - 2019 සැප්තැම්බර් මස 28 වැනි සෙනසුරාදා - 2019.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

නිවේදනයයි

ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන විෂය භාර අමාත්‍ය දොන් ආතර් චාමර සම්පත් දසනායක වන මා විසින්, 1992 අංක 02 දරන ප්‍රඥප්තියෙන් හා 1993 අංක 04 දරන ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 08 කරන ඌව පළාතේ මුදල් ප්‍රඥප්තියේ 77 වන වගන්තිය යටතේ සහ 104 අ වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ දිරිගැන්වීමේ දීමනා අරමුදලට අදාළ නියෝග මෙයින් පනවනු ලැබේ. මෙම නියෝග 2017.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු වන්නේ ය.

**දොන් ආතර් චාමර සම්පත් දසනායක,**
ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ,
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍ය.
ඌව පළාත.

2019 සැප්තැම්බර් මස 20 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

PG 4682 - 12 (2019/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1990 අංක 08 දරන ඌව පළාතේ මුදල් ප්‍රඥප්තිය

### නියෝග

1. 1990 අංක 8 දරන ඌව පළාතේ මුදල් ප්‍රඥප්තියේ 77 වන වගන්තිය යටතේ සහ 104 අ. වගන්තිය යටතේ ඌව පළාත් මුදල් විෂයභාර අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව, මෙම නියෝග පනවනු ලබන අතර, 2017.01.01 දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

2. මෙහි මින්මතු '' ප්‍රඥප්තිය '' යනුවෙන් හඳුන්වනු ලබන, 1990 අංක 8 දරන ඌව පළාතේ මුදල් ප්‍රඥප්තියේ 104අ. වගන්තියේ සඳහන් විධිවිධාන පරිදි පළාත් ආදායම් දෙපාර්තමේන්තු නිලධාරින් දිරිගැන්වීමේ දීමනා අරමුදල පරිපාලනය කිරීම සහ ඊට ආනුෂාංගික වෙනත් කරුණු පිළිබඳව විධිවිධාන සැලසීම පිණිස මෙම නියෝග පනවනු ලැබේ. මෙම නියෝග '' පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ දිරිගැන්වීමේ දීමනා අරමුදල් නියෝග '' ලෙස හඳුන්වනු ලැබේ.

3. මෙහි මින්මතු '' අරමුදල '' යනුවෙන් හඳුන්වනු ලබන පළාත් ආදයම් දෙපාර්තමේන්තු නිලධාරින් දිරිගැන්වීමේ දීමනා අරමුදල් ගිණුමක් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යා යුතු ය.

4. අරමුදල පවත්වාගෙන යාමේ අරමුණු ප්‍රඥප්තියේ 104 අ (3) (අ) සහ (ආ) හි සඳහන් කරුණු සඳහා වන්නේ ය. එනම්,

   (1) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන් සඳහා දිරි දීමනා ගෙවීම.

   (2) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුභසාධන කටයුතු සඳහා අවශ්‍ය වන මුදල් ලබා දීම.

5. මෙහි මින්මතු '' කමිටුව '' යනුවෙන් හඳුන්වනු ලබන සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් අරමුදල පරිපාලනය කළ යුතු අතර, කමිටුවේ සංයුතිය පහත ආකාරයෙන් විය යුතු ය.

   (1) ඌව පළාතේ ප්‍රධාන ලේකම් ;
   (2) මුදල් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් ;
   (3) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) ;
   (4) පළාත් ආදායම් කොමසාරිස් ;
   (5) නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස් ;
   (6) පළාත් ආදායම් කොමසාරිස් විසින් නම් කරනු ලබන පළාත් ආදායම් සේවයේ නිලධාරින් දෙදෙනෙකු

6. අරමුදලේ ගිණුම පහත ප්‍රභවයන්ගෙන් සමන්විත විය යුතු වන්නේ ය.

1990 අංක 08 දරන ඌව පළාත් සභා මුදල් ප්‍රඥප්තියේ 104 (2) වගන්තියේ ප්‍රකාරව දිරි දීමනා කාර්යය සඳහා පළාත් සභාව විසින් වාර්ෂිකව විසර්ජනය කරනු ලබන මුදල් ප්‍රමාණ :-

(අ) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් ප්‍රඥප්තියක සඳහන් විධිවිධානවලට අනුව යම් තැනැත්තෙකු විසින් ගෙවිය යුතු බවට නියම කර ඇති බද්දක් හෝ ගාස්තුවක් නියමිත කාලයේ දී නිසි පරිදි ගෙවා නොමැති අවස්ථාවක ක්‍රියාත්මක වී එම නියමිත බද්ද හෝ ගාස්තුව ආදායමක් ලෙස රැස්කර ගනු ලැබූ අවස්ථාවක ; සහ

පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ප්‍රඥප්තියක් යටතේ ඉදිරිපත් කළ යුතු බවට එකී ප්‍රඥප්ති මගින් නියම කර ඇති වාර්තා නොසැපයීම සහ යම් වාර්තාවක ප්‍රකාශ කර ඇති පරිදි පිරිවැටුම, යම් සාධන පත්‍රයක ප්‍රකාශ කර ඇති වටිනාකම, ප්‍රඥප්තියේ විධිවිධාන අනුව පරීක්ෂා කිරීමේ දී අසත්‍ය ලෙස ප්‍රකාශ කර ඇති බවට තහවුරු වීම යන කරුණ මත තක්සේරුකරුවෙකු විසින් කරනු ලබන තක්සේරුවක් ; සහ

පළාත් ආදායම් දෙපාර්තමේන්තු නිලධාරින්ගේ අතිරේක පරිශ්‍රමයෙන් අයකරගනු ලබන ආදායමෙන් 25% ක් සහ

(ආ) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ප්‍රඥප්තියක් යටතේ පනවනු ලබන දඩ සහ දණ්ඩන මගින් රැස්කරනු ලබන ආදායමෙන් 5% ක් ද,

අරමුදල් ගිණුමට බැර කළ යුතු මුදල් ප්‍රමාණය සඳහා පාදක විය යුතු ය.

7. පහත සඳහන් කරුණු සඳහා පමණක් අරමුදලින් මුදල් ගෙවීම සිදු කළ යුතු ය.

(1) '' අරමුදල '' පිහිටුවීමේ අරමුණු වන ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරින්හට අර්ධ වාර්ෂිකව ලබා දෙන දිරි දීමනා සඳහා සහ වැටුප් සංශෝධනයන්හි දී උද්ගත වන හිඟ දිරිදීමනා ලබා දීම සඳහා ;

(2) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුභසාධන කටයුතු සඳහා.

8. (1) අරමුදලේ මුද්‍රාව කමිටුව විසින් කලින් කල තීරණය කරනු ලබන කමිටුවේ සාමාජිකයෙකු භාරයේ තැබිය යුතු ය.

(3) කමිටුවේ අනුමතය ඇතිව මිස සහ තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී ලේඛනයෙහි අත්සන් තැබිය යුතු කමිටුවේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කමිටුවේ මුද්‍රාව කිසිදු ලේඛනයකට නොතැබිය යුතු ය.

(4) කමිටුවේ සභාපති සහ ලේකම් වශයෙන් කමිටුවේ සාමාජිකයින් දෙදෙනෙකු කමිටුව මගින් තෝරා පත් කර ගත යුතු ය.

(5) කමිටුවේ සභාපති විසින් රැස්වීම්වල මුලසුන දැරිය යුතු අතර, සෑම රැස්වීමකට ම සභාපති සහභාගි විය යුතුය. කමිටුවේ යම් රැස්වීමක දී තීරණයක් ගැනීම සඳහා වූ සියළු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය. ලැබී ඇති ඡන්ද සංඛ්‍යාව එක සමාන වන අවස්ථාවක දී සභාපතිවරයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් හිමි විය යුතු ය.

(6) (1) කමිටුවේ ලේකම්වරයාගේ කාර්යභාරය පහත පරිදි වන්නේ ය.

(අ) සභාපතිවරයාගේ අනුදැනුම මත රැස්වීම් කැඳවීම.
(ආ) කමිටු රැස්වීම්වලට අදාළ වාර්තා ලිවීම සහ ඒවා සුරක්ෂිතව තබා ගැනීම.
(ඇ) කමිටුව වෙත ලැබෙන ශක්‍යතාවයෙන් යුතු යෝජනා කමිටුව වෙත ඉදිරිපත් කිරීම.
(ඈ) කමිටුව වෙනුවෙන් ලිපි ගණුදෙනු කිරීම.
(ඉ) කමිටුවේ ලිපි ගණුදෙනුවලට අදාළව ලේඛන පවත්වාගෙන යෑම.

(1) කමිටුවේ සනපූරණය සාමාජිකයින් පස් දෙනෙකු විය යුතු ය.

(2) කමිටුවේ රැස්වීම් සහ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් එහි කාර්ය පටිපාටිය කමිටුව විසින් විධිමත් කරගත යුතු ය.

(3) දිරිදීමනා ගෙවීමේ කාර්යය පටිපාටිය මගින් විධිමත් කර ඇති ආකාරයට ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරින්හට දිරිදීමනා ගෙවීමේ දී නිලධාරින් ඇගයීමේ කටයුතු පළාත් ආදායම් කොමසාරිස්ගේ ප්‍රධානත්වයෙන් යුතු ත්‍රී පුද්ගල අනු කමිටුවක් මඟින් සිදු කළ යුතු අතර, එකී අනු කමිටුව, අරමුදල් කමිටුවේ අනුමැතියෙන් පත් කළ යුතු ය. අනු කමිටු තීරණ කමිටුවේ අනුමැතියට යටත් විය යුතු ය.

9. කමිටුව විසින් පහත කාර්යයන් ඉටු කළ යුතු ය.

(1) අරමුදලේ අරමුණුවලට අදාළව ශක්‍යතාවයකින් යුතු යෝජනා සලකා බලා ඒ සඳහා අනුමැතිය ලබා දීම සහ අවශ්‍ය මුදල් නිදහස් කිරීම.

(2) ප්‍රඥප්තියේ 104 අ (3) වගන්තියේ දක්වා ඇති කරුණු විධිමත් කරන ලද අරමුදල් කාර්යය පටිපාටිය මගින් දක්වා ඇති කරුණු සඳහා පමණක් මුදල් ගෙවීමට කටයුතු කිරීම.

(3) අරමුදලින් මුදල් ගෙවීම විධිමත් කර ඇති කාර්යය පටිපාටිය අනුව, අනු කමිටුවේ තීරණ මත කමිටුව මඟින් අනුමත කරනු ලබන අනුපාතයට දිරිදීමනා ගෙවීම සඳහා අනුමැතිය ලබා දීම.

10. (1) අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් වන්නේ ය.

(7) අරමුදලේ ගිණුම සම්බන්ධව එක් එක් ලිත් වර්ෂය සඳහා පිළියෙල කරන අවසන් ගිණුම් වාර්තා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් ව පවත්වාගෙන යා යුතු ය.

11. (1) මෙම නියෝග ක්‍රියාත්මක කිරීම විධිමත් කිරීම සඳහා අදාළ වන දිරිදීමනා අරමුදලේ කාර්යය පටිපාටිය නියම කිරීම, ක්‍රමවේදය සහ ආකෘති පත්‍ර නියම කිරීම හා ඊට ආනුෂාංගික කාරණා විධිමත් කිරීම සඳහා දිරිදීමනා අරමුදලේ කාර්යය පටිපාටිය අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කළ හැකි ය.

(2) එකී කාර්ය පටිපාටිය අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු ය.

12. පද සම්බන්ධව අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ නියෝගවල ;

'' පළාත '' යන්නෙන් ඌව පළාත ද,

'' පළාත් සභාව '' යන්නෙන් ඌව පළාතේ පළාත් සභාව ද,

'' මුදල් අමාත්‍යවරයා '' යන්නෙන් ඌව පළාත් මුදල් විෂයභාර අමාත්‍යවරයා ද,

'' ප්‍රධාන ලේකම් '' යන්නෙන් ඌව පළාතේ ප්‍රධාන ලේකම් ද,

'' මුදල් අමාත්‍යාංශයේ ලේකම් '' යන්නෙන් ඌව පළාත් මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් ද,

'' කොමසාරිස් '' යන්නෙන් ඌව පළාත් ආදායම් කොමසාරිස් ද,

'' අරමුදල '' යන්නෙන් ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තු දිරිගැන්වීමේ දීමනා අරමුදල ද,

'' ගිණුම '' යන්නෙන් ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තු දිරිගැන්වීමේ දීමනා අරමුදල් ගිණුම ද,

'' කමිටුව '' යන්නෙන් ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තු දිරිගැන්වීමේ දීමනා අරමුදලේ කමිටුව ද,

'' සභාපති '' යන්නෙන් ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තු දිරිගැන්වීමේ දීමනා අරමුදලේ කමිටුවේ සභාපතිවරයා ද,

'' පළමු අර්ධ වර්ෂය '' යන්නෙන් ලිත් වර්ෂයක ජනවාරි පළමු වැනි දින සිට ජුනි මස 30 වැනි දින දක්වා මාස හයක කාලය ද,

'' දෙවන අර්ධ වර්ෂය '' යන්නෙන් ලිත් වර්ෂයක ජූලි මස පළමු වැනි දින සිට දෙසැම්බර් මස මස 31 වැනි දින දක්වා මාස හයක කාලය ද, වන්නේ ය.

13. මෙම නියෝගවල සිංහල සහ දෙමළ පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

10 - 503

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.